විශ්‍රාම වැටුප් චක්‍රලේඛ: 01/2025

මගේ අංකය: Pen/Pol/06/10-2025
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10.
2025.05. 29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / දිස්ත්‍රික් ලේකම්වරුන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

## 2025 අයවැය යෝජනා අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප් ගැලපීම

2025.03.25 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 මගින් රාජ්‍ය සේවයේ තනතුරු / සේවා / සේවා ගණ සඳහා ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 මගින් අග්‍රවිනිශ්චයකාරවරයා සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් සඳහා ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 මගින් මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයින් සඳහා ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 මගින් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා ද, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 මගින් ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවා සඳහා ද, 2025 අයවැය යෝජනා අනුව ප්‍රකාශිත පරිදි වැටුප් ගෙවීමට අදාළ විධිවිධාන නිකුත් කර ඇත.

02. ඉහත චක්‍රලේඛ විධිවිධාන අනුව අදියර 03ක් යටතේ වැටුප් ගෙවීම ක්‍රියාත්මක කිරීමටත්, නව වැටුප් පරිමාණ 2025.01.01 දින සිට බලාත්මක කිරීමට සහ 2025.04.01 දින සිට කිසිදු හිඟ ගෙවීමකින් තොරව එම නව වැටුප් පරිමාණ අනුව වැටුප් ගෙවීමටත් තීරණය කර ඇත.

03. පහත 04 ඡේදයේ සඳහන් කර ඇති තනතුරු / සේවා / සේවා ගණ සඳහා විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂික, මරණ පාරිතෝෂික සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අතරින් අදාළ කර ගත යුතු විධිවිධාන පිළිබඳ සාරාංශයක් පහතින් දක්වා ඇත.

| අනු අංක | අදාළ වන තනතුරු / සේවා / සේවා ගණ | අදාළ කර ගත යුතු විධිවිධාන | | |
|---|---|---|---|---|
| | | විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගණනය කිරීම | මරණ පාරිතෝෂික ගණනය කිරීම | වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම |
| i | රාජ්‍ය සේවයේ තනතුරු / සේවා / සේවා ගණ | 04.1.1 | 04.1.2 | 04.1.3 |

| | | | | |
|---|---|---|---|---|
| ii | අග්‍රවිනිශ්චයකාරවරයා සහ උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් | 04.2.1 | 04.2.2 | 04.2.3 |
| iii | මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ ශ්‍රී ලංකා අධිකරණ සේවයේ නිලධරයින් | 04.3.1 | 04.3.2 | 04.3.3 |
| iv | පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය | 04.4.1 | 04.4.2 | 04.4.3 |
| v | ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන් | 04.5.1 | 04.5.2 | 04.5.3 |

04. ඉහත පරිදි වැටුප් සංශෝධනය සිදු කිරීමේ දී ඒ අනුව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම පහත පරිදි සිදු කළ යුතු ය.

**04.1. 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම.**

**04.1.1.විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් ගෙවිය යුත්තේ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව සකස් කරන ලද මාසික විශ්‍රාම වැටුප වේ. මෙම නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව නැවත සකස් කළ යුතු අතර, එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවිය යුතු ය.

ii. ඉහත 04.1.1 (i) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

iii. 2025.04.01 දින ද සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම

වැටුප් පාරිතෝෂිකය, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන III හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කළ යුතු ය.

v. ඉහත 04.1.1 (i) හි සඳහන් නිලධරයන් සඳහා 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි වන අතර, ඉහත 04.1.1 (iii) හි සඳහන් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි නොවේ.

අ) 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන රු. 5,000/- මාසික දීමනාව.

ආ) 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රු. 3,000/-ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

**04.1.2.** මරණ පාරිතෝෂිකය

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීමේ දී, නිලධරයා මිය ගිය දිනට ලබමින් සිටි වැටුප එනම්, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප මත මරණ පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය යන නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමි ගැන්වීමේ දී නිලධරයා මියයන දිනය වන විට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන III හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව එය ගණනය කිරීම සිදු කළ යුතු ය.

**04.1.3.** වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

**04.1.3.1. සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප අනුව

ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය යන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය.

**04.1.3.2. විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මිය යන නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන II හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

04.2. **2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි විධිවිධාන අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම.**

04.2.1. **විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් ගෙවිය යුත්තේ 2018.04.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2018 අනුව සකස් කරන ලද මාසික විශ්‍රාම වැටුප වේ. මෙම නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව නැවත සකස් කළ යුතු අතර එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවිය යුතු ය.

ii. ඉහත 04.2.1 (i) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

iii. 2025.04.01 දින ද සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කළ යුතු ය.

v. ඉහත 04.2.1 (i) හි සඳහන් නිලධරයන් සඳහා 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමිවන අතර, ඉහත 04.2.1 (iii) හි සඳහන් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි නොවේ.

අ) 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන රු. 5,000/- මාසික දීමනාව.

ආ) 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රු. 3,000/-ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

**04.2.2. මරණ පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමිගැන්වීමේ දී නිලධරයා මියගිය දිනට ලබමින් සිටි වැටුප එනම්, 2018.04.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2018 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප මත මරණ පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය යන නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමි ගැන්වීමේ දී නිලධරයා මියයන දිනය වන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව එය ගණනය කිරීම සිදු කළ යුතු ය.

**04.2.3. වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්**

**04.2.3.1. සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2018.04.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2018 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු

නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය.

**04.2.3.2. විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2018.04.02 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2018 අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම් සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

**04.3. 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි විධිවිධාන අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම.**

**04.3.1. විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් ගෙවිය යුත්තේ 2018.02.19 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව සකස් කරන ලද මාසික විශ්‍රාම වැටුප වේ. මෙම නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ

අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව නැවත සකස් කළ යුතු අතර එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවිය යුතු ය.

ii. ඉහත 04.3.1 (i) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

iii. 2025.04.01 දින ද සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කළ යුතු ය.

v. ඉහත 04.3.1 (i) හි සඳහන් නිලධරයන් සඳහා 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි වන අතර, ඉහත 04.3.1 (iii) හි සඳහන් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි නොවේ.

අ) 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන රු. 5,000/- මාසික දීමනාව.

ආ) 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රු. 3,000/-ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

**04.3.2. මරණ පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීමේ දී නිලධරයා මියගිය දිනට ලබමින් සිටි වැටුප එනම්, 2018.02.19 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප මත මරණ පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමි ගැන්වීමේ දී නිලධරයා මිය යන දිනය වන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව එය ගණනය කිරීම සිදු කළ යුතු ය.

### 04.3.3. වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

#### 04.3.3.1. සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2018.02.19 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

#### 04.3.3.2. විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මිය යන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2018.02.19 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2018 අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප

වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මිය යන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

**04.4. 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි විධිවිධාන අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම.**

**04.4.1. විශ්‍රාම වැටුප් හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් ගෙවිය යුත්තේ 2016.11.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2016 අනුව සකස් කරන ලද මාසික විශ්‍රාම වැටුප වේ. මෙම නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව නැවත සකස් කළ යුතු අතර එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවිය යුතු ය.

ii. ඉහත 04.4.1 (i) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

iii. 2025.04.01 දින ද සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කළ යුතු ය.

v. ඉහත 04.4.1 (i) හි සඳහන් නිලධරයන් සඳහා 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි වන අතර, ඉහත 04.4.1 (iii) හි සඳහන් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි නොවේ.

අ) 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන රු. 5,000/- මාසික දීමනාව.

ආ) 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රු. 3,000/-ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

**04.4.2.** මරණ පාරිතෝෂිකය

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීමේ දී නිලධරයා මියගිය දිනට ලබමින් සිටි වැටුප එනම්, 2016.11.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2016 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප මත මරණ පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමිගැන්වීමේ දී නිලධරයා මියයන දිනය වන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව එය ගණනය කිරීම සිදු කළ යුතු ය.

**04.4.3.** වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

**04.4.3.1. සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.11.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ

අංක 06/2016 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය යන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

**04.4.3.2. විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.11.07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 06/2016 අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීමේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

04.5. 2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි විධිවිධාන අනුව වැටුප් සංශෝධනයට අදාළව විශ්‍රාම වැටුප්, විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගණනය කිරීම.

04.5.1. විශ්‍රාම වැටුප් හා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත 2025.06.30 දින තෙක් ගෙවිය යුත්තේ 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 අනුව සකස් කරන ලද මාසික විශ්‍රාම වැටුප වේ. මෙම නිලධරයන්ගේ මාසික විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව නැවත සකස් කළ යුතු අතර එසේ සකස් කරන ලද විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට ගෙවිය යුතු ය.

ii. ඉහත 04.5.1 (i) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි සඳහන් නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය නොකෙරේ.

iii. 2025.04.01 දින ද සේවයේ සිට ඉන් පසුව විශ්‍රාම ගනු ලබන නිලධරයන්ට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප් ගෙවනු ලැබේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව ගණනය කළ යුතු ය.

v. ඉහත 04.5.1 (i) හි සඳහන් නිලධරයන් සඳහා 2025.06.30 දින තෙක් පමණක් විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි වන අතර, ඉහත 04.5.1 (iii) හි සඳහන් නිලධරයන් සඳහා විශ්‍රාම වැටුප සමඟ පහත දීමනා හිමි නොවේ.

අ) 2022.01.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2022 අනුව විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන රු. 5,000/- මාසික දීමනාව.

ආ) 2024.08.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2024 අනුව මාසිකව ගෙවනු ලබන රු. 3,000/-ක විශේෂ අන්තර්කාලීන දීමනාව.

**04.5.2.** මරණ පාරිතෝෂිකය

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂිකය හිමි ගැන්වීමේ දී නිලධරයා මියගිය දිනට ලබමින් සිටි වැටුප එනම්, 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප මත මරණ පාරිතෝෂිකය ගණනය කිරීම සිදු කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ යැපෙන්නන් වෙත මරණ පාරිතෝෂික හිමි ගැන්වීමේ දී නිලධරයා මියයන දිනය වන විට කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන II හි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව එය ගණනය කිරීම සිදු කළ යුතු ය.

**04.5.3.** වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්

**04.5.3.1. සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට 2025.03.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මිය ගොස් ඇති නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 අනුව නිලධරයා වෙත ගෙවමින් තිබූ වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට 2026.12.31 දින තෙක් සේවයේ යෙදී සිටිය දී මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු

නොකළ වැටුප, වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමි ගැන්වීම සිදු කළ යුතු ය.

**04.5.3.2. විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන් වෙනුවෙන් වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම**

i. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව 2025.06.30 දින තෙක් කාලසීමාව තුළ මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත 2016.04.29 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 03/2016 අනුව නිලධරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීමට පදනම් කරගත් වැටුප අනුව ගණනය කරන අඩු නොකළ වැටුප වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ලෙස හිමිගැන්වීම සිදු කළ යුතු ය. ඉහත පරිදි හිමිගන්වන වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කර 2025.07.01 දින සිට ගෙවීම් කළ යුතු ය.

ii. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ ඊට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන විශ්‍රාම වැටුප් හිමිකම ලබා ගැනීමෙන් පසුව මියයන නිලධරයන්ගේ වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා අනත්දරුවන් වෙත වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමි ගැන්වීමේ දී කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 05/2025 හි උපලේඛන I හි සඳහන් නව වැටුප් පරිමාණ අනුව සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන අඩු නොකළ වැටුප හිමිගැන්වීම සිදු කළ යුතු ය.

**05. පොදු කරුණු**

i. විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගණනය කිරීමේ දී ඇමුණුම 01, 02, 03 සහ 04 හි ඇතුළත් ප්‍රතිශත වගු පහත පරිදි භාවිත කළ යුතු ය.

අ) ඉහත 04.1, 04.3 සහ 04.4 ඡේදයන්හි සඳහන් නිලධරයන් වෙත ගෙවිය යුතු මාසික විශ්‍රාම වැටුප ඉහත සඳහන් චක්‍රලේඛවල උපලේඛනයන්හි ඇතුළත් නව වැටුප් පරිමාණ මත පදනම්ව ගණනය කිරීමේ දී ඒ සඳහා ඇමුණුම 01 හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.

ආ) ඉහත 04.1, 04.3 සහ 04.4 ඡේදයන්හි සඳහන් නිලධරයන් අතරින් 2025.04.01 දින ද සේවයේ යෙදී සිට අවසන් වරට 2025.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසුව විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණනය කිරීමේ දී ඇමුණුම 02 හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.

ඇ) ඉහත 04.1, 04.3 සහ 04.4 ඡේදයන්හි සඳහන් නිලධරයන් අතරින් 2026.01.01 දින ද සේවයේ යෙදී සිට අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසුව විශ්‍රාම ගන්නා නිලධරයන් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණනය කිරීමේ දී ඇමුණුම 03 හි ඇතුළත් ප්‍රතිශත වගුව භාවිත කළ යුතු ය.

ඈ) ඉහත 04.5 ඡේදය යටතේ සඳහන් කර ඇති නිලධරයන් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණනය කිරීමේ දී ඇමුණුම 04 හි ඇතුළත් ප්‍රතිශත වගු භාවිත කළ යුතු ය.

ii. 2025.01.01 දින ද සේවයේ සිට අවසන් වරට 2025.03.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගෙන ඇති නිලධරයන්ට අදාළව විශ්‍රාම වැටුප් අයදුම්පත්‍ර යොමු කිරීමේ දී විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 මගින් හඳුන්වා දී ඇති PD 03 අයදුම්පත්‍රය භාවිත කළ යුතු ය. 2025.07.01 දිනට මෙම නිලධරයන්ට අදාළ නව වැටුප් පරිමාණ මත පදනම්ව වැටුප සකස් කිරීම එම නිලධරයන් අවසන් වරට සේවයේ යෙදී සිටි ආයතන විසින් සිදු කළ යුතු අතර එය නිවැරදිව සිදු කිරීම පිළිබඳ වගකීම අදාළ ආයතනයේ ප්‍රධානියා වෙත පැවරේ. නව වැටුප් පරිමාණ අනුව වැටුප සකස් කිරීමෙන් පසුව වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් විශ්‍රාමික නිලධරයාගේ පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කළ යුතු අතර නිලධරයා වෙත ද පිටපතක් යොමු කළ යුතු ය.

iii. ඉහත 05 (ii) හි සඳහන් නිලධරයන්ගේ විශ්‍රාම වැටුප 2025.07.01 දින සිට අදාළ නව වැටුප් පරිමාණ මත පදනම්ව සංශෝධනය කිරීම සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය මගින් 2025.06.15 දින සිට හඳුන්වාදෙන අන්තර්කාලීන ක්‍රමවේදය (Interim Solution) ඔස්සේ නිලධරයා අවසන් වරට සේවය කළ ආයතනය මගින් අයදුම් කිරීම අනිවාර්ය වේ.

iv. 2025.04.01 දින ද සේවයේ සිට අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසුව විශ්‍රාම ගන්නා නිලධරයන්ට අදාළව මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව PD 03 අයදුම්පත්‍ර යොමු කිරීමට හැකිවන පරිදි, විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය නවීකරණය කරනු ලැබේ.

v. 2025.04.01 දින ද සේවයේ සිට, අවසන් වරට 2026.12.31 දින හෝ එදිනට පෙර දිනයක හෝ සේවයෙන් පසු විශ්‍රාම ගනු ලබන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණනය කිරීමට අදාළ ආදර්ශ ගණනය කිරීමක් ඇමුණුම 05 හි ඇතුළත් කර ඇත.

vi. වයස අවු.60 සම්පූර්ණ වී විශ්‍රාම ලබා ගන්නා නිලධරයන්ගේ උපයා ගත් වැටුප් වර්ධක ගණනය කළ යුතු ආකාරය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016 (සංශෝධන I) හි සඳහන් කර ඇති අතර එය පාදක කර ගනිමින් උපයාගත් වැටුප් වර්ධක ගණනය කිරීම සිදු කළ යුතු ය. (ඇමුණුම 06)

vii. ඉහත 05 (iii) හි සඳහන් නිලධරයන්ට අදාළව යොමු කරන අයදුම්පත්‍රය සමඟ වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් ද විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය වෙත උඩුගත (Upload) කළ යුතු ය.

viii. ඉහත 01 ඡේදයේ සඳහන් චක්‍රලේඛ විධිවිධාන අනුව සිදු කරනු ලබන වැටුප් සංශෝධනයට අදාළව වැටුපෙහි සම්පූර්ණ ශුද්ධ වැඩිවීම 2027.01.01 දිනට සේවයේ නියුතු වූ නිලධරයන්ට හිමිවන බැවින්, එදිනට පසු විශ්‍රාම යන හෝ මියයන නිලධරයන්ගේ විශ්‍රාම වැටුප, විශ්‍රාම පාරිතෝෂිකය හෝ මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප ගණනය කිරීමේ දී මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළ නොවේ.

ix. ඉහත 05 (iv) හි සඳහන් කළ පරිදි, විශ්‍රාම වැටුප් කළමනාකරණ දත්ත පද්ධතිය නවීකරණය කරන තෙක්, 2025.04.01 දින ද සේවයේ සිට ඉන්පසුව විශ්‍රාම යන නිලධරයන්ට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව විශ්‍රාම වැටුප් හිමිගැන්වීම සඳහා අන්තර්කාලීන ක්‍රමවේදයක් (Interim Solution) අනුගමනය කරනු ලැබේ. එහි දී විශ්‍රාම ගනු ලබන අවස්ථාවේ නිලධරයාගේ වැටුපට අදාළව ඔහුට ගෙවන මුදල මත පදනම්ව මාසික විශ්‍රාම වැටුප සහ විශ්‍රාම පාරිතෝෂිකය ගණනය කිරීම පළමු අදියරේ දී සිදු කරනු ලබන අතර, දෙවන අදියරේ දී 2027.01.01 දිනට නිලධරයාට හිමිවිය යුතු සම්පූර්ණ මාසික වැටුප මත පදනම්ව විශ්‍රාම වැටුප ගැලපීම සිදුකරනු ලැබේ. මෙයට අදාළ විධිවිධාන ඇතුළත් කරමින් විශ්‍රාම වැටුප් උපදෙස් ලිපියක් නිකුත් කරනු ලැබේ.

06. මෙම චක්‍රලේඛයේ උපදෙස් වැරදි ලෙස නිර්වචනය කිරීම හේතුවෙන් හෝ ලියවිලිවල වැරදීමක් හේතුවෙන් හෝ ගණනය කිරීමේ දී ඇතිවන වැරදීමක් හේතුවෙන් හෝ වෙනත් වැරදීමක් හේතුවෙන් හෝ කිසියම් විශ්‍රාමික නිලධරයකුට වැඩිපුර මුදලක් ගෙවා ඇත්නම්, එවැනි වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු ගෙවීමට එම නිලධරයා බැඳී සිටී.

07. මෙම චක්‍රලේඛය අනුව කටයුතු කිරීමේ දී එහි විධිවිධාන සම්බන්ධයෙන් පැහැදිලි කරගැනීම් හෝ වැඩිදුර උපදෙස් අවශ්‍යවන අවස්ථාවල දී සහ පැනනගින තාක්ෂණික ගැටළු නිරාකරණය කරගැනීම සඳහා පහත සඳහන් දුරකතන අංක වෙත සම්බන්ධ විය හැකි ය.

| අනු අංකය | තනතුර | දුරකථන අංකය |
|---|---|---|
| 01. | අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති හා විමර්ශන) | 011 2 421 786 |
| 02. | අධ්‍යක්ෂ ( ඩිජිටල් පරිපාලන සහ සේවා) | 011 2 431 729 |

| | | |
|---|---|---|
| 03. | අධ්‍යක්ෂ (විශ්‍රාම වැටුප්) | 011 2 320 045 |
| 04. | අධ්‍යක්ෂ (වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප්) | 011 2 336 913 |
| 05. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමධ්‍යගත) | 011 2 322 278 |
| 06. | නියෝජ්‍ය අධ්‍යක්ෂ (මධ්‍යගත) | 011 2 434 414 |
| 07. | සහකාර අධ්‍යක්ෂ (විදේශ විශ්‍රාම වැටුප්) සහ (සන්නද්ධ සේවා-වැ.බ.) | 011 2 327 752 |

08. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ සහ මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

Azhami


චාමින්ද හෙට්ටිආරච්චි

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

දුරකතනය : 011 2 421786

ෆැක්ස් : 011 2 431413

විද්‍යුත් ලිපිනය : pen7policydep@gmail.com


**පිටපත් :**

1) ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2) අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කරු. දැ.ගැ.ස.
4) ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
5) ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු. දැ.ගැ.ස.
6) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
7) ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
8) විගණකාධිපති - කරු. දැ.ගැ.ස.
9) පාර්ලිමේන්තු මහ ලේකම් - කරු. දැ.ගැ.ස සහ සහ අ.ක.ස.

ඇමුණුම 01

**2025.01.02 දින සිට විශ්‍රාම වැටුප් ගණන් බැලීමේ ප්‍රතිශත චක්‍රය**

| සේවා කාලය → | අවු. 25 | | අවු. 25 මාස 06 | | අවු. 26 | | අවු. 26 මාස 06 | | අවු. 27 | | අවු. 27 මාස 06 | | අවු. 28 | | අවු. 28 මාස 06 | | අවු. 29 | | අවු. 29 මාස 06 | | අවු. 30 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම ලබා ගන්නා අවස්ථාවේ දී වාර්ෂික වැටුප (රු.) | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 563400 ට අඩු | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 | 90 | 85 |
| 563400-575160 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 |
| 575161-594600 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 |
| 594601-615120 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 |
| 615121-633480 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 |
| 633481-750120 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 |
| 750121-1001760 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 |
| 1001761-1302600 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 |
| 1302601-1389000 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 |
| 1389001-1649640 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 |
| 1649640 ට වැඩි | 75 | 65 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 |

ඇමුණුම 02

2025.04.02 දින සිට 2026.01.01 දින දක්වා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණන් බැලීමේ ප්‍රතිශත චක්‍රය

| සේවා කාලය → | අවු. 25 | | අවු. 25 මාස 06 | | අවු. 26 | | අවු. 26 මාස 06 | | අවු. 27 | | අවු. 27 මාස 06 | | අවු. 28 | | අවු. 28 මාස 06 | | අවු. 29 | | අවු. 29 මාස 06 | | අවු. 30 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම ලබා ගන්නා අවස්ථාවේ දී ලැබූ වාර්ෂික වැටුප (රු.) | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 510060 ට අඩු | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 | 90 | 85 |
| 510060-518124 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 |
| 518125-531516 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 |
| 531517-545652 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 |
| 545653-558300 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 |
| 558301-638700 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 |
| 638701-811884 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 |
| 811885-1019100 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 |
| 1019101-1078668 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 |
| 1078669-1257996 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 |
| 1257996 ට වැඩි | 75 | 65 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 |

ඇමුණුම 03

**2026.01.02 දින සිට 2027.01.01 දින දක්වා විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණන් බැලීමේ ප්‍රතිශත චක්‍රය**

| සේවා කාලය → | අවු. 25 | | අවු. 25 මාස 06 | | අවු. 26 | | අවු. 26 මාස 06 | | අවු. 27 | | අවු. 27 මාස 06 | | අවු. 28 | | අවු. 28 මාස 06 | | අවු. 29 | | අවු. 29 මාස 06 | | අවු. 30 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විශ්‍රාම ලබා ගන්නා අවස්ථාවේ දී ලැබූ වාර්ෂික වැටුප (රු.) | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 536736 ට අඩු | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 | 90 | 85 |
| 536736-546648 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 | 90 | 84 |
| 546649-563064 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 | 90 | 83 |
| 563065-580392 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 | 90 | 82 |
| 580393-595896 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 | 90 | 81 |
| 595897-694416 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 | 90 | 80 |
| 694417-906828 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 | 89 | 79 |
| 906829-1160856 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 | 88 | 78 |
| 1160857-1233840 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 | 87 | 77 |
| 1233841-1453824 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 | 86 | 76 |
| 1453824 ට වැඩි | 75 | 65 | 76 | 66 | 77 | 67 | 78 | 68 | 79 | 69 | 80 | 70 | 81 | 71 | 82 | 72 | 83 | 73 | 84 | 74 | 85 | 75 |

ඇමුණුම 04

<u>ත්‍රිවිධ සන්නද්ධ හමුදා සේවාවන් හි විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂික ගණන් බැලීමේ ප්‍රතිශත වක්‍රය</u>

| විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව (සේවා කාලය අනුව හිමි සීයයට ප්‍රමාණය) | | | | |
|---|---|---|---|---|
| | නිලධාරී | | | |
| | 2009.05.19 ට පෙර | | 2009.05.19 ට පසු | |
| | පැරණි ප්‍රතිශතය | | නව ප්‍රතිශතය | |
| අවුරුදු | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 10 | 55 | 45 | | |
| 11 | 56 | 46 | | |
| 12 | 57 | 47 | | |
| 13 | 58 | 48 | | |
| 14 | 59 | 49 | | |
| 15 | 60 | 50 | 75 | 65 |
| 16 | 61 | 51 | 76 | 66 |
| 17 | 62 | 52 | 77 | 67 |
| 18 | 63 | 53 | 78 | 68 |
| 19 | 64 | 54 | 79 | 69 |
| 20 | 65 | 55 | 80 | 70 |
| 21 | 66 | 56 | 81 | 71 |
| 22 | 67 | 57 | 85 | 75 |
| 23 | 68 | 58 | 85 | 75 |
| 24 | 69 | 59 | 85 | 75 |
| 25 | 70 | 60 | 85 | 75 |
| 26 | 71 | 61 | 85 | 75 |
| 27 | 72 | 62 | 85 | 75 |
| 28 | 73 | 63 | 85 | 75 |
| 29 | 74 | 64 | 85 | 75 |
| 30 | 75 | 65 | 85 | 75 |
| 31 | 77 | 67 | 85 | 75 |
| 32 | 79 | 69 | 85 | 75 |
| 33 | 81 | 71 | 85 | 75 |
| 34 | 83 | 73 | 85 | 75 |
| 35 | 85 | 75 | 85 | 75 |

| විශ්‍රාම වැටුප් ප්‍රතිශත වගුව (සේවා කාලය අනුව හිමි සියයට ප්‍රමාණය) | | | | |
|---|---|---|---|---|
| | සෙසු නිල | | | |
| | 2009.05.19 ට පෙර | | 2009.05.19 ට පසු | |
| | පැරණි ප්‍රතිශතය | | නව ප්‍රතිශතය | |
| අවුරුදු | අඩු නොකළ | අඩු කළ | අඩු නොකළ | අඩු කළ |
| 10 | | | | |
| 11 | | | | |
| 12 | 60 | 50 | | |
| 13 | 61 | 51 | | |
| 14 | 62 | 52 | | |
| 15 | 63 | 53 | 78 | 68 |
| 16 | 64 | 54 | 79 | 69 |
| 17 | 65 | 55 | 80 | 70 |
| 18 | 66 | 56 | 81 | 71 |
| 19 | 67 | 57 | 82 | 72 |
| 20 | 68 | 58 | 83 | 73 |
| 21 | 69 | 59 | 84 | 74 |
| 22 | 70 | 60 | 85 | 75 |
| 23 | 71 | 61 | 85 | 75 |
| 24 | 72 | 62 | 85 | 75 |
| 25 | 73 | 63 | 85 | 75 |
| 26 | 74 | 64 | 85 | 75 |
| 27 | 75 | 65 | 85 | 75 |
| 28 | 76 | 66 | 85 | 75 |
| 29 | 77 | 67 | 85 | 75 |
| 30 | 78 | 68 | 85 | 75 |
| 31 | 80 | 70 | 85 | 75 |
| 32 | 82 | 72 | 85 | 75 |
| 33 | 84 | 74 | 85 | 75 |
| 34 | 86 | 76 | 85 | 75 |
| 35 | 88 | 78 | 85 | 75 |

## ආදර්ශ ගණනය කිරීම -1

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධරයෙකු වශයෙන් 2025.04.05 දිනට වයස අවු.56ක් සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම ගනු ලැබූ නිලධරයෙකුගේ විශ්‍රාම වැටුප සහ විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන අනුව ගණනය කිරීම

1. උපන් දිනය : 1969.04.05
2. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත මුල් පත්වීම් දිනය : 1995.02.01
3. විශ්‍රාම ගන්වන ලද දිනය : 2025.04.05
4. සේවා කාලය : අවු.30 මාස 02 දින 04
5. වැටුප් කේතය : MN2-2016
6. අදාළ වන වැටුප් චක්‍රලේඛය : රා.ප.ච. 10/2025
7. රා.ප.ච. 10/2025 අනුව අවසන් වරට ලැබූ මාසික වැටුප : රු.66,364/-
   (වැටුප් පරිවර්තන ලිපිය අමුණා ඇත.)

8. **විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය ගණනය කිරීම**

   i. ශුද්ධ සේවා කාලය : අවු. 30 මාස 02 දින 04

   ii. රා.ප.ච. 10/2025හි උපලේඛන IIIහි සඳහන් නිලධරයාගේ වැටුපට අදාළව විශ්‍රාම ගන්වන අවස්ථාව වන විට ගෙවන ලද මුදල අනුව වාර්ෂික වැටුප } රු. 66,364/- x12=රු. 796,368/-

   iii. ඉහත 8 (i) හා (ii) අනුව අදාළ ප්‍රතිශත : අඩු නොකළ 89% | අඩු කළ 79%

   iv. අඩු නොකළ මාසික වැටුප : $\frac{\text{රු.796,368/- x 89\%}}{12}$ = රු.59,063.96 ——— (A)

   v. අඩු කළ මාසික වැටුප : $\frac{\text{රු.796,368/- x 79\%}}{12}$ = රු.52,427.56 ——— (B)

   vi. හිමිවන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය : රු. 796,368/- x 89% x 2 = **රු. 1,417,535.04**

9. **මාසික විශ්‍රාම වැටුප ගණනය කිරීම**

   i. රා.ප.ච. 10/2025 උපලේඛන II හි නව වැටුප් පරිමාණය අනුව හිමිවන සම්පූර්ණ මාසික වැටුප } රු. 81,610/-

   ii. වාර්ෂික වැටුප : රු. 81,610/- x 12 = රු. 979,320/-

   iii. ඉහත 8 (i) හා 9 (ii) අනුව අදාළ ප්‍රතිශත : අඩු නොකළ 89% | අඩු කළ 79%

   iv. රා.ප.ච. 10/2025 උපලේඛන II හි නව වැටුප් පරිමාණය අනුව අඩු නොකළ මාසික වැටුප } $\frac{\text{රු. 979,320/- x 89\%}}{12}$ = රු. 72,632.90 —— (C)

   v. රා.ප.ච. 10/2025 උපලේඛන II හි නව වැටුප් පරිමාණය අනුව අඩු කළ මාසික වැටුප } $\frac{\text{රු. 979,320/- x 79\%}}{12}$ = රු. 64,471.90

   vi. හිමිවන මාසික විශ්‍රාම වැටුප : (C) - (A-B)
   රු. 72,632.90 – (රු. 59,063.96 - රු. 52,427.56)
   **රු. 65,996.50**

විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2016 (සංශෝධනය I)

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2016
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10.
2016.06.01

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාධිපති වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් / පළාත් පාලන ආයතන ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>2016.01.01 දිනෙන් පසු විශ්‍රාම ගන්නා රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප ගැලපීම</u>**

උක්ත කරුණ සම්බන්ධව මවිසින් නිකුත් කරන ලද 2016.04.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 03/2016 ට අමතර වශයෙනි.

02. එම චක්‍රලේඛයේ 02 වන ඡේදය ප්‍රකාරව කටයුතු කිරීමේදී වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාම ලබාගන්නා නිලධාරීන්ගේ උපයාගත් වැටුප් වර්ධක ගණනය කල යුතු ආකාරය ඇමුණුම 01 හි සඳහන් වන අතර එය පාදක කර ගනිමින් උපයාගත් වැටුප් වර්ධක ගණනය කිරීම සිදුකළ යුතුය. ඒ සමඟ මෙම පරිවර්තනයට අදාළ වර්ෂයට අයත්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 සඳහන් වැටුප් පරිවර්තන ලිපියේ පිටපතක් PD 03 හා PD 06 අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

03. 2016.04.27 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/2016 හි 06 වන ඡේදයේ සඳහන් PD 6 අයදුම් පත්‍රයද සංශෝධනය කර ඇමුණුම 02 ලෙස ඇතුළත් කර ඇත. ඒ අනුව ඉදිරියේ දී සංශෝධිත අයදුම්පත් යොමු කිරීමේදී මෙම ආකෘතිය භාවිතා කළ යුතුය.

04. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව යොමුකර ඇති නිවැරදි නොවන අයදුම්පත්‍ර ආයතන වෙත යොමු කිරීමට කටයුතු කරන අතර නිවැරදිව සකස් කරන ලද අයදුම්පත් නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

ඒ. ජගත් ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:
1. ජනාධිපති ලේකම් - කරු. දැ. ගැ. සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - එම
3. අමාත්‍ය මණ්ඩල ලේකම් - එම
4. ලේකම් - රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.
5. ලේකම් - මුදල් අමාත්‍යාංශය
6. ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7. ලේකම් - ජාතික වැටුප් කොමිෂන් සභාව
8. විගණකාධිපති - අ.ක.ස.

ඇමුණුම01

උදා: 01

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ ii වන පංතියේ නිළධාරියෙකු වශයෙන් 2016.05.27. දින විශ්‍රාම ගනු ලැබූ නිළධාරියෙකුගේ වැටුප් වර්ධක අගය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016හි වැටුප් ක්‍රමය අනුව සකස් කිරීම.

උපන් දිනය : 1956.05.27
සේවා කාලය : අවු: 25
වැටුප් ඛාණ්ඩය : MN2 -2016

| වැටුප් චක්‍රලේඛය: | රා.ප. චක්‍රලේඛ අංක 6/2006(1v) අනුව | රා.ප. චක්‍රලේඛ අංක 3/2016 අනුව |
|---|---|---|
| වැටුප් පරිමාණය: | 13,990-10*145-170*11-240*6-320*14-23,320 | 28,940-300*10-350*11-560*10-660*10-47,990 |

රා.ප.ච. 6/2006 ට අනුව අවසන් වරට ලැබූ මාසික වැටුප: රු.16,290

රා.ප.ච.අංක 3/2016 අනුව ගණනය කිරීම.

| වර්ෂය | 2016 වර්ෂය | 2020 වර්ෂය |
|---|---|---|
| වැටුප් පියවර ගණන | 05 | 05 |
| වැටුප් වර්ධක දිනය | 11/26 | 11/26 |
| 1.විශ්‍රාමගත් අවස්ථාවේදී දළ වාර්ෂික වැටුප රු. | 19,770 x 12 = 237,240 | 33,690 x 12 = 404,280 |
| 2.මීලඟ වැටුප් පියවර රු. | 19,976 x 12 = 239,712 | 34,040 x 12 = 408,480 |
| 3.වැටුප් වර්ධක වෙනස රු. (2-1) | 2,472 | 4,200 |
| 4.උපයාගත් වැටුප් වර්ධක අනුපාතික අගය ගණනය කිරීම | (2,472 x 183)/366 | (4,200 x 183)/366 |
| **5.උපයා ගත් වැටුප් වර්ධක අගය රු.** | **1,236** | **2,100** |
| 6.විශ්‍රාම වැටුප් සහිත දීමනා රු. (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.විශ්‍රාම වැටුප ගණනයට අදාළ වැටුප (1+5+6) රු. | 238,476 | 406,380 |
| 8.වි.වැ.ච. 3/2016 අඩු නොකළ ප්‍රතිශතය | 80% | 80% |
| 9.වි.වැ.ච. 3/2016 අඩු කළ ප්‍රතිශතය | 70% | 70% |
| 10.හිමිවන අඩු නොකළ මාසික වැටුප රු.(7 x 8)/12 | 15,898.40 | 27,092.00 |
| 11.හිමිවන අඩු කළ මාසික වැටුප රු.(7 x 9)/12 | 13,911.10 | 23,705.50 |
| 12.හිමිවන පාරිතෝෂිකය රු. (7 x 8) x 2 | 381,561.60 | හිමිකම නැත |

උදා: 02

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ iii වන පංතියේ නිළධාරියෙකු වශයෙන් 2016.04.30. දින විශ්‍රාම ගනු ලැබූ නිලධාරියෙකුගේ වැටුප් වර්ධක අගය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 හි වැටුප් ක්‍රමය අනුව සකස් කිරීම .

උපන් දිනය : 1956.04.30

සේවා කාලය : අවු: 30

වැටුප් ඛාණ්ඩය: SL1 -2016

වැටුප් චක්‍රලේඛය: රා.ප. චක්‍ර 6/2006 අනුව — රා.ප. චක්‍ර 3/2016 අනුව

වැටුප් පරිමාණය: 22,935–10*645-8*790-17*1,050-53,555 — 47,615-10*1,335-8*1,630-17*2,170-110,895 .

රා.ප.ච. 6/2006 ට අනුව අවසන් වරට ලැබූ මාසික වැටුප: රු. 28,740

රා.ප.ච.අංක 3/2016 අනුව ගණනය කිරීම.

| වර්ෂය | **2016 වර්ෂය** | **2020 වර්ෂය** |
|---|---|---|
| වැටුප් පියවර ගණන | 10 | 10 |
| වැටුප් වර්ධක දිනය | 9/01 | 9/01 |
| 1.විශ්‍රාම ගත් අවස්ථාවේදී දළ වාර්ෂික වැටුප රු. | 34,918 x 12 = 419,016 | 59,630 x 12 = 715,560 |
| 2.මීලඟ වැටුප් පියවර රු. | 35,701 x 12 = 428,412 | 60,965 x 12 = 731,580 |
| 3.වැටුප් වර්ධක වෙනස රු. (2-1) | 9,396 | 16,020 |
| 4.උපයා ගත් වැටුප් වර්ධක අනුපාතික අගය ගණනය කිරීම | (9,396 x 242)/366 | (16,020 x 242)/366 |
| **5.උපයාගත් වැටුප් වර්ධක අගය රු.** | **6,212.66** | **10,592.46** |
| 6.විශ්‍රාම වැටුප් සහිත දීමනා රු. (අදාළ වන්නේ නම් පමණි) | අදාළ නොවේ | අදාළ නොවේ |
| 7.විශ්‍රාම වැටුප ගණනයට අදාල වාර්ෂික වැටුප (1+5+6) රු. | 425,228.66 | 726,152.46 |
| 8.වි.වැ.ච.3/2016 අඩු නොකළ ප්‍රතිශතය | 88% | 88% |
| 9.වි.වැ.ච.3/2016 අඩු කළ ප්‍රතිශතය | 78% | 78% |
| 10.හිමිවන අඩු නොකළ මාසික වැටුප රු.(7 x 8)/12 | 31,183.44 | 53,251.18 |
| 11.හිමිවන අඩු කළ මාසික වැටුප රු.(7 x 9)/12 | 27,639.86 | 47,199.90 |
| 12.හිමිවන පාරිතෝෂිකය රු. (7 x 8) x 2 | 748,402.44 | හිමිකම නැත |